කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ 08

අවසාන වාර පරීක්ෂණය - 2016

# බුද්ධ ධර්මය - I

11 ශ්‍රේණිය | කාලය පැය 01 යි

**සැලකිය යුතුයි.**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. බුදු දහම තුළ ආර්ය ධන සතක් සඳහන් වේ. එයට අදාළ වන අංගය වන්නේ,
    (1) සීලය (2) මුදිතාව
    (3) සත්‍ය වචනය (4) අලෝභය

02. චතුර්විධ සැප හා චතුර්විධ සම්ප්‍රදායන් සඳහන් වන සූත්‍ර දෙක පිළිවෙලින්
    (1) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය හා අණන සූත්‍රය
    (2) අණන සූත්‍රය හා ව්‍යග්ඝපජ්ජ සූත්‍රය
    (3) පත්තකම්ම සූත්‍රය හා අණන සූත්‍රය
    (4) අණන සූත්‍රය හා සිගාලෝවාද සූත්‍රය

03. බුදු දහමේ සඳහන් නිදහස් චින්තනය පිළිබඳ සඳහන් ප්‍රසිද්ධ සූත්‍රයකි, කාලාම සූත්‍රය එය සඳහන් වන නිකාය වන්නේ,
    (1) දීඝ නිකාය (2) මජ්ඣිම නිකාය
    (3) අංගුත්තර නිකාය (4) ඛුද්දක නිකාය

04. සතර සංග්‍රහ වස්තුවල සඳහන් අර්ථ චර්යාව පිළිබඳ සරල අදහස වන්නේ,
    (1) අනුන්ගේ දියුණුවට උදව් කිරීම
    (2) අනුන්ට කරුණාව දැක්වීම
    (3) අනුන්ගේ යහපත් පිළිවෙත් අනුකරණය කිරීමයි
    (4) අනුන්ගේ දියුණුවට අකුල් හෙළිය නොයුතු බවයි

05. බුදුරජාණන් වහන්සේ චූල්ලකම්ම විභංග සූත්‍රය තෝදෙය්‍ය පුත්‍ර සුභ මානවකයාට දේශනා කළේ
    (1) ජේතවනාරාමයේදීය (2) පූර්වාරාමයේදීය
    (3) ඉසිපතනාරාමයේදීය (4) වේළුවනාරාමයේදී

06. පටිච්ච සමුප්පාදයට අනුව දුප්පත්කම හා සමාජ ගැටලු ඇතිවන අයුරු දේශනා කළ සූත්‍රයකි
    (1) මහා නිදාන සූත්‍රය (2) ඉසිගිලිය සූත්‍රය
    (3) අග්ගිවච්ඡගොත්ත සූත්‍රය (4) චක්කවත්ති සීහනාද සූත්‍රය

07. භෞතික ධර්මයන්ගේ ක්‍රියාකාරිත්වයට ද පටිච්ච සමුප්පාද න්‍යාය ධර්මය පොදු වූවක් බව දැක්වෙන සූත්‍රයකි.
(1) අග්ගිවච්ඡගොත්ත සූත්‍රය (2) චූල්ලකම්මවිභංග සූත්‍රය
(3) දම්සක් පැවතුම් සූත්‍රය (4) මහා නිදාන සූත්‍රය

08. බෞද්ධ සාහිත්‍යයේ " වෙජ්ජපතෝ ජිනවරෝ " ලෙස හැඳින්වූයේ,
(1) ආනන්ද මහරහතන් වහන්සේ (2) ජීවක වෛද්‍යවරයා
(3) බුදුරජාණන් වහන්සේ (4) මහා කාශ්‍යප මහරහතන් වහන්සේ

09. බොහෝ පිංකම්වලදී බෞද්ධ ජනයා පූජා කරන විශේෂ පිරිකරයකි අටපිරිකර. එම අටපිරිකරයට අයත් නොවන පූජා ද්‍රව්‍යයකි.
(1) ඇලි පිහිය (2) දෙපට සිවුර
(3) තනිපට සිවුර (4) බෙහෙත් ද්‍රව්‍ය

10. බෞද්ධ කලා ශිල්ප රාශියක් ශ්‍රී ලංකාව තුළ විවිධ ප්‍රදේශවල දක්නට ලැබේ. ඒ අතරින් ශ්‍රී ලංකාවටම ආවේණික කලා නිර්මාණයකි.
(1) ස්තූපය (2) මුරගල
(3) වාහල්කඩ (4) සඳකඩ පහණ

11. අනුරාධපුර රාජධානියේ ඉදි වූ මහා මෙවුනා උයන ඉදිකළේ
(1) මුටසීව රජතුමා (2) දේවානම් පියතිස්ස රජතුමා
(3) වළගම්බා රජතුමා (4) දුටුගැමුණු රජතුමා

12. බෞද්ධ ශාසන ඉතිහාසයේ ප්‍රථම වරට බෝධි පූජාවක් කළ රජතුමා ලෙස හැඳින්වෙන්නේ,
(1) දුටුගැමුණු රජතුමා (2) දේවානම්පියතිස්ස රජතුමා
(3) ධර්මාශෝක රජතුමා (4) කණිෂ්ක රජතුමා

13. " යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතු තථාගතෝ ආහ " යන ගාථා ධර්මය කවුරුන් විසින් කා හට දේශනා කරන ලද්දක් ද ?
(1) බුදුරජාණන් වහන්සේ විසින් අනද හිමියන්ට
(2) අස්සජි මහ රහතන් වහන්සේ විසින් උපතිස්ස පිරිවැජියාට ය
(3) අස්සජි මහ රහතන් වහන්සේ විසින් කෝලිත පිරිවැජියාට ය
(4) මහා කාශ්‍යප හිමියන් විසින් සැරියුත් හිමියන්ටය

14. මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලංකාවේ භික්ෂු ශාසනය ස්ථාපිත වූයේ,
(1) භණ්ඩුක උපාසකතුමා පැවිදිවීමෙන් පසුව ය
(2) සුමන සාමණේරයන් උපසම්පදා වීමත් සමඟ ය
(3) අරිට්ඨ කුමරු පැවිදිවීමත් සමඟ ය
(4) අනුලා දේවිය පැවිදිවීමෙන් පසුව ය

15. " චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය " යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළේ,
(1) අගසව් දෙනමටය (2) ආනන්ද හිමියන්ට ය
(3) ප්‍රථම රහත් හැට නමටය (4) භද්දවග්ගිය කුමාරවරුන්ට ය

B

16. බුදුන් වහන්සේ මුහුණ දුන් අභියෝගයක් නොවන්නේ මින් කුමක් ද ?
(1) නාලාගිරි දමනය (2) අංගුලිමාල දමනය
(3) ආලවක දමනය (4) ගිහිගෙය හැරයාම

17. සමථ භාවනාව සඳහා යොදාගත හැකි කර්මස්ථාන හතලිහකි. ඒ අතරින් කසිණ
(1) පහකි (2) දහයකි
(3) එකකි (4) එකොළහකි

18. රේරුකානේ චන්ද්‍රවිමල නා හිමියන් උපත ලැබූ වර්ෂය වන්නේ,
(1) 1987 (2) 1897
(3) 1788 (4) 1878

19. ප්‍රාග් බෞද්ධ යුගයේ මෙරට තිබූ ඇදහිලි ක්‍රමයක් නොවන්නේ,
(1) මළවුන් පිදීම (2) බෝධි වන්දනය
(3) වෘක්ෂ වන්දනය (4) ගිනි දෙවියන් පිදීම

20. අවිජ්ජාව හේතුවෙන් සංඛාරා උපදින අතර සංඛාර නිසා,
(1) නාම රූප උපදී (2) විඤ්ඤාණ උපදී
(2) සළායතන උපදී (4) වේදනා උපදී

21. ස්තූපයක ගර්භයට ඉහළින් පිහිටි අංගය වන්නේ,
(1) හතරැස් කොටුවයි (2) දේවතා කොටුවයි
(3) කොත් කැරැල්ලයි (4) චූඩා මාණික්‍යයයි

22. පොළොන්නරු යුගයේ දී රචිත සාහිත්‍ය ග්‍රන්ථයක් නොවන්නේ මින් කුමක් ද ?
(1) අමාවතුර (2) ධර්ම ප්‍රදීපිකාව
(3) බුත්සරණ (4) පූජාවලිය

23. තෙවන ධර්ම සංගායනාවෙන් පසු අපරන්ත දේශයට වැඩම කළ භික්ෂූන් වහන්සේ වන්නේ,
(1) මිහිඳු හිමි (2) සෝණ උත්තර හිමි
(3) මහාදේව හිමි (4) යෝනක ධම්ම රක්ඛිත හිමි

24. '' බොර ජලයෙහි කිසිවක් පැහැදිලිව නොපෙනේ '' එය උපමා කළේ නීවරණ ධර්මයන්ගේ,
(1) කාමච්ඡන්දයටය (2) ථීන මිද්ධයටය
(3) විචිකිච්ඡාවටය (4) ව්‍යාපාදයටය

25. සාරාර්ථ සංග්‍රහය රචනා කළ බෞද්ධ පඬිරුවන වූයේ
(1) සරණංකර සංඝරාජ හිමිය (2) තොටගමුවේ රාහුල හිමිය
(3) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමිය (4) වෑත්තෑවේ හිමිය

26. සිල් රැකීමෙන් ලැබෙන ආනිසංසයක් නොවන්නේ,
(1) කීර්තිය පැතිරීමය
(2) ඕනෑම පිරිසක් මැදට නිර්භයව එළඹීමට හැකි වීමයි
(3) මරණින් මතු සුගතියෙහි ඉපදීමය
(4) සිහිමුලාවෙන් කළුරිය කිරීමය

525

27. පටිච්ච සමුප්පාද නයාය ධර්මයට අනුව " ඉමස්මිං අසති ඉදං න හෝති " යන පාලි පාඨයේ සිංහල අදහස වන්නේ,

(1) මෙය නැති කල්හි මෙය නොවේ (2) මෙය ඇති කල්හි මෙය වේ
(3) මෙය ඉපදීමෙන් මෙය උපදී (4) මෙය නැති වී යාමෙන් මෙය නැතිවී යයි

28. බුදුරාජාණන් වහන්සේ සියලු ලෝ වැසි සතුන් උදෙසා තම කාලය, ශ්‍රමය කැප කළේ අවුරුදු

(1) 35 කි (2) 45 කි (3) 55 කි (4) 65 කි

29. උතුම් වූ බුදු බව ලබාදීමට උපකාරී වූ ඇසතු බෝධි වෘක්ෂයට කෘතවේදීත්වය දැක්වූයේ සත් සතියේ

(1) දෙවන සතියේය (2) තෙවන සතියේය
(3) සිව්වන සතියේය (4) පස්වන සතියේය

30. බුදුරාජාණන් වහන්සේ වර්ණනාවට ලක් වූ විශාලා මහනුවර සුන්දර ස්ථානයක් ලෙස හැඳින්වූයේ

(1) සත්තම්භක චෛත්‍යය (2) සප්තපර්ණී ගුහාවය
(3) චෞර ප්‍රපාතය (4) තපෝධාරාමය

31. බුද්ධ කාලීන වජ්ජි රාජ්‍යය ආරක්‍ෂා කළ සප්ත අපරිහානි ධර්ම සඳහන් වන්නේ,

(1) මහා පරිනිබ්බාන සූත්‍රයේ ය. (2) කූටදන්ත සූත්‍රයේ ය.
(3) මහා සමය සූත්‍රයේ ය. (4) සිගාලෝවාද සූත්‍රයේ ය.

32. දෙවන පැරකුම්බා රජතුමා විසින් රචනා කරන ලද මහා කාව්‍යයක් වන කව්සිළුමිණ ග්‍රන්ථයට පාදක වූ ජාතක කතාව වන්නේ

(1) සත්තු භත්ත ජාතකය යි. (2) කුස ජාතකය යි.
(3) වෙස්සන්තර ජාතකය යි. (4) මහාකපි ජාතකය යි.

33. බෞද්ධ පද්‍ය හා ගද්‍ය සාහිත්‍ය පොත් පරිශීලනයෙන් බොදු ජනයාට ලද නොහැකි ප්‍රයෝජනයකි,

(1) ශ්‍රද්ධාව ජනනය වීම.
(2) රස වින්දනයක් ලැබේ.
(3) ගද්‍ය ඡේදයක් ශ්‍රැති ගෝචර ශෛලියෙන් ගායනා කිරීමට හැකි වේ.
(4) බුද්ධාලම්භන ප්‍රීතිය ඇති නොකරයි.

34. බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වන පරිදි "රජතුමා" යන්න අර්ථ දක්වන්නේ,

(1) ජනතාව සතුටු කරන්නා (2) ජනතාව පෝෂණය කරන්නා
(3) ජනතාව සමෘද්ධි කරන්නා (4) ජනතාව සමඟ ජීවත්වන්නා

35. සඳකඩ පහණ පිළිබඳ අර්ථ දක්වන මහාචාර්ය සෙනරත් පරණවිතානයන් "සරල ලියවැල" තුළින් සංකේතවත් කරනු ලබන්නේ යැයි අර්ථ දැක්වූයේ,

(1) සසරින් එතෙර වීම (2) තුනී වූ තණ්හාව
(3) කෙලෙසුන් (4) සසර බියෙන් මිදී නිවන කරා යාම